හෙල බසේ අසිරිය

කුරුප්පු සූරීන්ගේ ලියවිල්ලක් සීරුවෙන් කියවීම මගේ සිරිතක්. ඔවුන්ගේ ලිපිවල අලුත් යමක් මෙන් ම අර්තවත් වූ යමක් තිබෙන නිසාය ඒ. ඔවුන්ගේ ලියවිල්ලක තිබුනු යමක් වරින් වර මතක් කරමින් තනියම සිනා වූ අවස්තා මට මතකය.

පසු ගිය අවුරුද්දේ නොවැම්බර් සන්නසට ඔවුන් ලියා තිබුනු 'බසක මහිම දුටුවෙමි' ලිපියද මගේ සිත් ගත් එකකි. එය දෙ-තුන් වරක්ම කියවා බැලීමට සිත් දුන්නේ එහෙයිනි. එය ඉතා රසවත් මෙන්ම හරවත් ලිපියකි.

'ප ත්' නුවරට පැමිනීම සඳහා 'සන්නසට' සති හතරක් හෝ පහක් ගත වීමත් මගේ විවේකය අඩු වීමත් නිසාය, මේ ලිපිය ලිවීම අත පසු වූයේ.

කුරුප්පු සූරීන්ගේ එම ලිපිය කාලෝචිත හරවත් එකක් බව නැවත වරක් කියමි. 'වහෙන් ඔරෝ' බාසාව නොදන්නා කුරුප්පු සූරීන් කිව යුත්ත කෙලින් කියා ඇති බව පෙනේ. මමද විච්චූරනය නවතා කෙලින්ම කතාව පටන් ගනිමි.

දිස්ත්‍රික් ලේකම් තුමාගේ නියාමනය ඇතිව සංවිදානය කරන ලද උත්සවයක් සඳහා තමන් ලත් සුලවත් ඇරයුමක් ගැන කියමින් ඔවුන් තම ලිපියට මුල පුරා තිබිනි.

අපේ බස එදිනෙදා සාමාන්‍ය වියහරේ පවතින සංවිදායක/ සංවිදානය, ප්‍රකාශක/ ප්‍රකාශනය, විවේචක/ විවේචනය, නිශ්පාදක/ නිශ්පාදනය, විදායක/ විදානය ආදී වචන දෙස බලන විට නියාමක/ නියාමනය යන වචන දෙකත් නිවැරදි විය යුතුය යන හැඟීමක් ඇති වේ. 'ආයාචක' යන්න අපට එතරම් හුරුපුරුදු වචනයක් නොවේ. එහෙත් 'ආයාචනය' යන වචනය අනුව ආයාචක/ ආයාචනය යන වචන දෙකද නිවැරදි විය යුතු යයි සිතමි. කෙසේ වෙතත් 'නියාමනය' යනු මඟ පෙන්වීම යන අරුත දෙන විදිමත්ව සැකසුනු වචනයක් බව පෙනේ. අපේ බාසා රීතියට අනුව එය පිලිගත යුතු පිලිගත හැකි වචනයකැයි සිතමි. සකු බස පිලිබඳව මට ඇත්තේ අල්ප දැනුමකි. එහෙයින් සකුව පිලිබඳ මනා දැනුමක් ඇත්තකු එය පහදා දුනහොත් එය බසට කරන සංග්‍රහයකි.

'සුළවත්' යන්නද අපට හුරුපුරුදු වචනයක් නොවේ. මා එය පලමු වරට දුටුවේ කුරුප්පු සූරීන්ගේ ලිපියේ ය. 'සුළවත්' යන්න මූර්දජ 'ළ' සහිතව ලියා ඇති නිසා 'ළය-හඳ යන තේරුම එහි ඇතැයි සිතමි. නිවැරදි බස් වහර පිලිබඳ දැනුම් තේරුම් ඇත්තකු 'සු - හද - වත්' යන තේරුම දෙනු පිනිස ඒ වචනය හදාගෙන ඇති බව මගේ හැඟීමයි. දැනට වියහරේ පවතින 'හිතවත්' යන්න ද ඊට සමානය. එයට 'සු' එකතු කොට 'සුහිතවත්' යනුවෙන් වචනයක් හැදී නැත. එ වැනි වචනයක් කියවීම අමාරුය. එහෙයින් එය කියවීමේ දී 'සිහිතවත්' වී අනතුරුව 'සීතවත්' වීමට උවත් බැරි නැත. එකම වචනය විවිද රූ ගෙන බසට ඇතුලු වී බාවිතා වූ සැටි 'සුමංගල සබ්ද කෝසය' බැලූ විට තේරුම් ගත හැකිය. එහෙයින් 'සුළවත්' යනු බැහැර කල යුතු වචනයක් නොවන බව පෙනේ. හිතවත්, සුහදවත්, ලබැදි, ලෙන්ගතු ආදි වචන තිබිය දී තවත් වචනයක් අවශ්‍ය ද යන ප්‍රශ්නය කෙනෙකුට ඇසිය හැකිය. ගැහැනිය - අඹ - කත - ලිය - කල - මාගම - වනිතාව - කාන්තාව ආදී නම් ගැන සිතන විට එය ප්‍රශ්නයක් නොවේ.

සුළවත් - සුළවතා - සුළවතෙක් - සුළවත්තු - සුළවතුන් සුළවත (සුළවතී) - සුළවතක් (සුළවතියක්) සුළවත්තු (සුළවතියෝ) සුළවතුන් (සුළවතියන්) ආදී වශයෙන්. එය වහරට ගත හැකිය.

'කොලු' ශබ්දය කොල්ලා - කොල්ලෙක් - කොල්ලෝ - කොල්ලන් යනුවෙනුත් 'කෙලි' කෙල්ල - කෙල්ලෙක් - කෙල්ලෝ - කෙල්ලන් යනුවෙනුත්‍ය වර නැඟෙන්නේ. ඒ අනුව 'බලු' බල්ලා - බල්ලෙක් - බල්ලෝ - බල්ලන් යනුවෙනුත් 'බැලි' බැල්ල - බැල්ලෙක් - බැල්ලෝ - බැල්ලන් යනුවෙනුත් ය වර නැඟෙන්නේ. එහෙත් අද බොහෝ දෙනා එය ක්‍රියා නාමයක් ලෙස වරනඟනු දක්නට ලැබේ. බල්ලා - බැල්ලී - බැල්ලියක් - බැල්ලියෝ - බැල්ලියන් නිවැරදි නම් කොල්ලා - කෙල්ලී - කෙල්ලියක් - කෙල්ලියෝ - කෙල්ලියන් ද නිවැරදි විය යුතුය.

(සිඟනු + ආ) සිඟන්නා - සිඟන්නෙක් - සිඟන්නෝ - සිඟන්නන් යන වර නැඟීමත් (සිඟනු + ඊ) සිඟන්නී - සිඟන්නියක් - සිඟන්නියෝ - සිඟන්නියන් යන වරනැඟීමත් නිවැරදිය. ඒ අනුයමින් බැලි, ඇතිනි, ආදී ශබ්ද වරනැගීම නිවැරදි නොවේ. මතුයම් දවසක බැල්ලි - බැල්ලියෝ අනුයමින් කෙල්ලී - කෙල්ලියෝ යන වහරක් ඇති වහරක් ඇති වුවත් එයට විරුදු වන්නෝ කවුරු ?

'දිනුම' තිබියදී 'වින් එකක්' ගැනීමත්, 'යැවීම' තිබිය දී 'සෙන්ඩ් කිරීමත්' අසාද්‍ය වාත රෝගයක ලකුණුය. දිනුම සහ යැවීම ගොඩයන්ගේ වචන නිසා එය 'නගරයන්ගේ' වචන බවට පත් කිරීම සඳහා කල 'ගෝතකරුමයක්' ලෙස එය සැලකීම යුතුය. ගම + ආ = ගමයා, ගොඩ + ආ = ගොඩයා යනු සමාන තේරුම් ඇති, එකම වියරන රීතියට අනුව හැදුනු පද දෙකකි. නගර + ආ = නගරයා ද ඒ අනුව හදා ගත හැකි පදයකි. අම්මා, තාත්තා, අක්කා, මාමා, නැන්දා, ගොඩයන්ගේ වචන නිසා ඒවා අම්මී, තාත්තී, අක්කී, මාමී, නැන්දී යනුවෙන් නගරයන්ගෙබසට හරවා ගෙන ඇති බව පෙනේ. ස්ත්‍රී ලිංග නාම පද එසේ නගරයන්ගේ බසට හරවා ගත් විට එක්තරා ගතියක් ද ඇති වේ.

අම්මී - අම්මිය, අම්මියක්, අම්මියෝ, අම්මියන්

අක්කී - අක්කිය, අක්කියක්, අක්කියෝ, අක්කියන්

නැන්දී - නැන්දිය, නැන්දියක්, නැන්දියෝ, නැන්දියන්

ආදී වශයෙන් ඒවා වර නැගිය හැකිවේ.

එහෙත් තාත්තී, මාමී වැනි පුරුශ ලිංග නාම පද වරනැගෙන්නේ තාත්තියා, තාත්තියෙක්, තාත්තියෝ, තාත්තියන් - මාමියා, මාමියෙක්, මාමියෝ, මාමියන් යනුවෙනි.

සිංහල වෙදකමට අනුව බරවාත් (බර + වාත) වාත රෝගයකි. හිරිවාතෙ, රත්ත වාතෙ, අපට හොඳට පුරුදු වාත නොවැ! ඉදිමීම මහත් වීම බරවා රෝගයේ ලක්ශනය. ඉතින් ඉහත දැක්වූ රෝගය 'මොලේ බරවා' ලෙස කෙනෙකුට පෙනෙන්නට පුලුවන. දැන් මොලේ උන රෝග යකුත් ඇති නිසා 'මොලේ බරවා' රෝගයේ අමුත්තක් ද ඇති නොවේ.

විනාශ, ප්‍රකාශ, ආශ්වාස, ප්‍රශ්යාස, විශ්වාස යනු සකු බසේ නාම පද පහකි. ඒවාවිනාශය, ප්‍රාකාශය, ආශ්වාසය, ප්‍රශ්වාසය, විශ්වාසය යනුවෙන් වරනැගේ. ඒ පදම අක්‍යාත පූරනය හැටියටත් 'කරනවා' ආක්‍යාතය හැටියටත් ගෙන විනාශ කරනවා, ප්‍රකාශකරනවා, විශ්වාස කරනවා, ආශ්වාස කරනවා, ප්‍රාශ්වාස කරනවා යනුවෙන් බාවිතා වේ.

පාඩම්, සෙල්ලම්, කිට්ටු, කෙට්ටු, මට්ටු දෙමලබසේ වචන පහකි. පාඩම, සෙල්ලමක්, කිට්ටුවට, කෙට්ටුව, මට්ටුවක් ආදී වශයෙන් නාම පද විදියට අපි ඒ වචන බාවිතා කරමු. ඒ හා සමඟම පාඩම් කරනවා, සෙල්ලම් කරනවා, කිට්ටු කරනවා, කෙට්ටු වෙනවා, මට්ටු වෙනවා යනුවෙන් අක්‍යාත පූරන විදියටත් බාවිතා කරමු. අපේ බොහෝ දෙනා සිතා ගෙන සිටින්නේ ඒවා සිංහල වචන ලෙසයි. මෙබඳු සකු සහ දෙමල වචන සිය දහස් ගනනක් සිංහල වචන විදියට වර නැඟෙන අතර වික්‍රමරත්න, විජයශේකර සහ නල්ලපෙරුම, රාසපුත්‍රම් යන පෙලපත් නම් ද සිංහල නම් බවට පත් වී තිබේ.

සිය බසට වචන ඇද ගැනීම කල යුත්තේත් කල හැක්කේත් සකු දෙමල බාසාවලින් පමනක් ද යනුවෙන් කෙනෙකු ඇසුවහොත් අපට 'ඔව්' කිව නොහැක. 'කේජු' දොදොල් මැලේ බාසාවේ වචනයි. පෑන, බැංකුව ඉංගිරීසි වචනයි. ඉන්දුනීසියා පිලිපීන ප්‍රවෘත්ති කියවන විට හරි හරියටම ඇසෙන්නේ ඉංගිරීසි වචනයි. අපේ බසට ඉංගිරීසි ඇද ගැනීමට ඒ හේතුවක් නොවේ. රේඩියෝවට ගුවන් විදුලි යන්ත්‍රයත් (ගුවන් විදුලි සිංහල වචන දෙකකි. යන්ත්‍රය සකු වචනයකි.) ලවුඩ් ස්පීකරයට ශබ්ද වාහිනී යන්ත්‍රයත් හදා ගැනීම වැනි බාල බොලඳ වැඩ ගැන හිතන විට සාමාන්‍ය මිනිස් දිවට ත්‍රී වීලර් එක, මොබයිල් ෆෝන් එක හුරු වීම ගැන පුදුම විය යුතු නැත. phone ෆොහොන, ෆහන, පොහොන, පහන යන හතර විදියටම බිඳ ගත හැකිය. Yard යන වචන තේරුම් පහක් දෙනු පිනිස යෙදෙන බව දික්නරිවල සඳහන් වේ. එහෙත් අප Yard බාවිතා කරන්නේ යාරය හැඳින්වීම සඳහා පමනි. park යන වචනය ක්‍රියාවක් ලෙස සලකා එයට සමාන සිංහල වචන විදියට 'හිටවනවා, නවතනවා' වැනි වචනයක් බාවිතා කල හැකි උවත් බොහො දෙනා 'පාක් කරනවා' යන වචනය බාවිතා කරන්නේ ඇයි ?. පාත් කරනවා, පත්තු කරනවා, පාඩම් කරනවා, පාච්චි කරනවා, පදම් කරනවා, යන වචන අතරට ඒ වචනය ගැනීමට අපට දැනෙන කිතිය සාදාරනද ?. බෝට්ටුව, ගේට්ටුව, සාක්කුව යක වචන අතරට පාක්කුව පාක් එක පැමිනි විට එලවා දැමීම සාදාරනද ?.

ජ්, ට්, ඩ්, ණ්, ළ්, ර්, ආදි අකුරුවලින් අවසන් වන වචන ආපේ බසේ නැතැයි සිතමි. ඇතුළු - ඇතුල් යන වියහරනක් ඇතත් 'ඇතුළ්' යන්න නැත. 'සියළු' යනු වැරදි වචනයකි. එය 'සියලු' විය යුතුය. බොහෝ දෙනා ලියන නිසා 'සියළු' නිවැරදි ලෙස පිලිගත යුතු යයි සිතන අයත් සටින්නට පුලුවන. එයත් ඔවුන් 'සියළ්ළන් / සියළ්ළෝ' නොලියනු ඇත.

රජ් - රජ, කට් - කට, බඩ් - බඩ, බණ් - බණ, දළ් - දළ, පාර් - පාර යනුවෙන් වියහරක් සිය බසේ නැත.

Ball යන ඉංගිරිසි වචනය වටය, බුස්ස, පන්ද යන තේරුම දීමේ දී 'බෝල' යනුවෙනුත් 'රඟ හමුව - රැඟුම් සාදය' යන තේරුම දීමේ දී (A ball is a large formal social event at which people dance - Collins Dic.) 'බාල්' යනුවෙනුත් අපේ බසේ වියහරට පැමින ඇත. බාල් + අ = බාල වී ඇති අතර බෝල + ආ = බෝලය වී ඇත. බෝල රාමුව මිස බෝලරාමුවක් අපට නැත. බාසාවකට වැදී හොඳින් වියහර වන වචනයක ජාතකය සොයා වෙහෙසිය යුතු නොවේ. එය බස් ඇඳුරන්ගේ කාරයකි.

ලියවිල්ලක් කියවනු අසා සිටින බස් ඇඳුරකුට 'අතන දන්තජ 'න' වෙනුවට කියැවුනේ මූර්දජ 'ණ' යන්නය -අතන 'ල' යන්න වෙනුවට කියැවුනේ 'ළ' යන්නය - අතන 'ශ' යන්න වෙනුවට කියැවුනේ 'ෂ' යන්නය' යනුවෙන් කිව හැකි ද? බුසල්, බුෂල්, බුශල් යන වචන තුන දෙවිදියකට මිස තුන් විදියකට කියවන්නන් මා දැක නැත.

උෂ්ණ - ප්‍රශ්න යන වචන දෙකේ _ෂ්ණ, _ශ්න දෙවිදියකට කියවන්නේ කවරෙක් ද? එහෙත් උශ්න - ප්‍රෂ්ණ වැරදිය.

අපි යලිත් කුරුප්පු සූරීන්ගේ ලිපිය දෙස බලමු. එහි ඇති ලියනගේ අමරකීර්ති සූරීන්ගෙ 'අටවක පුත්තු' නවකතාව මා කියවා නැත. එහෙයින් එහි කතාව ගැන මම කිදිවක් නොදනිමි.

පතක හෝ පොතක නමක් නපුන්සකලිංග නමක් විදියට වර නැඟීම අපේ බසේ රීතියයි. දිනමින, ලංකාදීප, මව්බිම, රාවය පුවත්පත් හතරක නම් ය.

- මට දිනමිනක් ගේන්න අමතක උනා.
- අද දිනමිනේ සීයාගේ ලිපියක් තියෙනවා.
- පුතාගේ කවි පන්තිය දිනමිනට යවන්න.

ආදී වශයෙන් ඒ නම් වරනැගේ.

අමාවතුර, බුත්සරන, තූප වංසය, දෛවයෝගය යනු අපේ පොත් හතරක නම් ය.

- අමාවතුරේ බාසාව හරි අමුතුයි.
- මං බුත්සරන කියෝලා නෑ.
- දෛවයෝගයක් මං ගාව නෑ. ආදී වශයෙන් ඒ නම් ද වර නැගේ.

ඒ රීතිය තවදුරටත් රැකිය යුතු යයි මම නොකියමි. මාටින් වික්‍රමසිංහ සූරීන්ගෙ 'ගැහැනියක්' නවකතාව (නවලුව) ඒ රීතියට පටහැනි ය.

'අටවක පුත්තු' යන නම 'අටවක පුත්තුවක්, අටවක පුත්තුවේ, අටවක පුත්තුවට,' යනුවෙන් වරනැඟිය හැකි නොවේ.

එදිරිසිංහ ජගතුන්ගේ 'අසුර අඩවියත්' ගනේවත්ත පාලිතයන්ගේ 'ඇවිත් නොරටකත්' ඒ දෙවිදියට ලියා ඇත.

ජිනදාස ලියනගේ, සමන් ගුරුගේ, පාලිත වෙදගේ වැනි නම් දෙස බලන විට ලියනගේ අමරකීර්තීන් තම නම නිවැරදිව ලියා ඇත. මුනිදාස කුමාරතුංග යනුවෙන් වැරදි විදියට තම නම ලියූ මුනිදාසයන් පසුව කුමාරතුංග මුනිදාස යනුවෙන් බාවිතා කලේ ඒ වරද දුටු නිසාය.

සමන් ගුරුගේයෝ, සුමනා දිසානායිකාවෝ අපේ බස් වහරට නොගැලපෙන බව ඔබ දනිතයි සිතමි. පෙලපත් නම ඉංගිරීසි විදියට නම අගට යෙදීම අමාරු වන්නේ අපේ පෙලපත් නම 'ගෙය හෝ ගෙදර' මුල් කරගෙන හැදී ඇති නිසා ය.

මම අමරකීර්තීන් කලු ද සුදු දැයි නොදනිමි; ඔවුන්ගේ 'අටවක පුත්තු' ගැන හසරක් නොදනිමි. කුරුප්පු සූරීන්ගේ ලිපියේ දැක්වෙන නිසා ඔවුන් ණ, ළ, ෂ යන මූර්දජ අකුරු නොලියන කෙනෙකු බව දනිමි. මට ඔවුන් වැදගත් වන්නේ මාත් කලක සිට ණ, ළ, ෂ නොලියන නිසාය.

සද දහම අනුව අපට න, ල, ශ කියවන්නේ කලාතුරකිනි; සීයට පහකටත් අඩුවෙනි. අකුරුවල සැකැස්ම අනුව නම් දන්තජ 'න, ල' දෙකත් තාලුජ 'ශ' යන්නත් මූර්දජ ණ, ළ, ෂ යන අකුරුවලට වඩා පහසුවෙන් ලියවේ. ඒ නිසා මාත් ණ, ළ, ෂ යන අකුරු තුන නොලියමි.

අමරකීර්තීන් න/ ණ, ල/ ළ ගැන දරන අදහසට කුරුප්පු සූරීන් ද එකඟ වන බව පෙනේ. එහෙත් 'ෂ' වෙනුවට 'ශ' ලිවීම ඔවුන්ගේ නොසතුටට හේතු වී ඇත. භාෂාව, භාසාව, බාසාව යන තුන් විදියම නිවැරදි ලෙස පිලිගනු ලැබේ. එය අපේ ඇස් වලට පුරුදු ය. එහෙත් 'භාශාව' අපේ ඇස්වලට පුරුදු නැති නිසා අපි එය බැහැර කරමු.

ඉංගිරීසි 'sh' දෙයකුරින් දෙන හඬ දෙනු පිනිස අපට ෂ් / ශ් යන අකුරු දෙකක් ඇත. 'ෂ්' නොලියන කෙනෙකුට ඇත්තේ 'ශ්' අකුරු පමනකි.

එසේම 'ශ්' නොලියන කෙනෙකුට ඇත්තේ 'ෂ්' පමනකි. ඔහු විෂාල, ෂෝකය ලියනවාට වඩා විසාල, සෝකය ලවීම හොඳය. එහෙත් ඔහුට 'ශ්/ෂ්' හඬ ලිවීම උවමනා නම් ඔහු ලිවිය යුත්තේ 'ෂ්' ය, ඔහු 'ශ්' නොලියන නිසාය, ඒ අනුව ශ්/ෂ් දෙකම නොලියන කෙනකුට දුස්කර, දක්ස, ලක්සන, විසේස, නිස්සංක, අවස්‍ය, ප්‍රස්න, සක්තිය, විසාල යන විදියටත් 'ශ්' නොලියන කෙනෙකුට දුෂ්කර, දක්ෂ, ලක්ෂන, විෂේෂ, නිෂ්ෂංක, අවෂ්‍ය, ප්‍රෂ්න, ෂක්තිය, විෂාල යන විදියටත්, 'ෂ්' නොලියන කෙනෙකුට දුශ්කර, දක්ශ, ලක්ශන, විශේශ, නිශ්ශංක, අවශ්‍ය, ප්‍රශ්න, ශක්තිය, විශාල යන විදියටත් ලිවීමට සිදු වේ.

අපි කොලොම්බියාවට 'ළො' ලියන්නේ අපේ ඇසට පුරුදු 'කොළඹ/ කොළඹ' නිසාය. ගෝගියා පාෂා, ෂැංහයි, බ නාඩ් ෂෝ වැනි නම් 'ෂ' යන්නෙන් ලියන්නේ ඇයි දැයි මම නොදැනිමි. කෙනෙකු පාශා, ශැංහයි, ශෝ ලියූ විට අපේ ඇසට පුරුදු නැති නිසා ඒ වැරදි යයි කිව හැකි ද?

අපේ (ළ් + උ) 'ළු' හැදී ඇත්තේ මහාප්‍රාන 'ළ' යන්නට සඤ්ඤක ලකුන '(' එකතු කිරීමෙනි. ඒ අනුව 'ස' යන්නට සඤ්ඤක ලකුන '(' එකතු කොට හදා ගන්නා අකුර හෝ ('ග' යන්න අගට ගැටය යොදා හදා ගන්නා 'ශ' යන්න මෙන්) 'හ' යන්න අගට ගැටය යොදා හදා ගන්නා අකුර 'ශ්/ෂ්' දෙක වෙනුවට බාවිතා කල හැකිය. දැනට එය නොකල හැකි නිසා අමරකීර්තීන් 'ෂ' වෙනුවට 'ශ' යෙදීම ගැන විරුදු වීම සාදාරන නැති සේ පෙනේ. මගේ පෞද්ගලික ලියමන්වල දී ණ/ න වෙනුවට '3' ඉලක්කමකින් අවසන් වන 'න' යන්නත් ළ/ ල වෙනුවට '3' ඉලක්කමකින් අවසන් වන 'ෆ' යන්නත්, 'ශ/ෂ' වෙනුවට '3' ඉලක්කමකින් අවසන් වන 'හ' යන්නත් මම බාවිතා කරමි.

වි. ක. ධර්මබන්ධු

මානවඩුගේ මාසය